(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 11(6).]

# පාර්ලිමේන්තුවේ අංක 11 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 ජූනි මස 20 වැනි සිකුරාදා**

---

## 2014 ජූලි මස 08 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3271/’12

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011, 2012 සහ 2013 වර්ෂවල දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් උපයාගත් ආදායම කොපමණද;

(ii) එකී අධිවේගී මාර්ගයේ මේ දක්වා ගමන්කර ඇති කාර් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම අධිවේගී මාර්ගයේ මේ දක්වා සිදුවී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) දක්ෂිණ අධිවේගී මාර්ගය කුමන හෝ හේතුවක් නිසා වසා දමනු ලැබුවේද;

(v) එසේ නම්, එකී වසා දැමීම සඳහා හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 29 දිනැති අංක 1847/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 128 අ වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 පෙබරවාරි මස 06 දිනැති අංක 1848/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග (අංක 1),— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වැනි වගන්තියේ (උ) ඡේදය සහ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, 51 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 15 දිනැති අංක 1771/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග (අංක 2),— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 27 වැනි සහ 28 වැනි වගන්ති සමග කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුනි 28 දිනැති අංක 1816/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2013 සැප්තැම්බර් 27 දිනැති අංක 1829/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නිවැරදි කර පළ කරනු ලැබ, 2014.06.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2014 ජූලි මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4486/’13

ගරු තිස්ස අත්තනායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වසරක් පාසා හලාවත මෝය ස්වභාවිකව ගොඩ වීම හේතුවෙන් එම ප්‍රදේශයේ ධීවර ජනතාව දැඩි අපහසුතාවයකට පත්වන බවත්;

(ii) මෝය ගොඩ වීම හේතුවෙන් මේ වන විට බෝට්ටු දියත් කිරීමේදී සිදු වූ අනතුරුවලින් පුද්ගල මරණ සහ බෝට්ටු විනාශවීම් රැසක් සිදුවී ඇති බවත් ;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හලාවත මෝය සංවර්ධනය කිරීම සඳහා මේ වන විට කිසියම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද;

(ii) හලාවත මෝය ගොඩ වීම පිළිබඳ සුදුසු පරීක්ෂාවක් සිදු කොට ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ක්‍රියාමාර්ග තුළින් එකී මෝය සංවර්ධනය කිරීම සඳහා ගත වන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4738/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ විදේශීය ක්‍රීඩා තරගාවලි සඳහා තෝරා ගනු ලබන පාසල් සිසුන් එම තරගාවලි සඳහා විදේශ රටවලට පිටත් කර යැවීම සඳහා නිසි වැඩ පිළිවෙළක් නොමැති බවත්;

(ii) එම තත්ත්වය යටතේ විදේශ ක්‍රීඩා තරගාවලි සඳහා තෝරා ගනු ලබන පාසල් දරුවන්ගේ දෙමාපියන් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නේනිද?

(ආ) විදේශ ක්‍රීඩා තරගාවලි සඳහා තෝරා ගනු ලබන සිසුන් එම තරගාවලි සඳහා පිටත් කිරීමට යම් අරමුදලක් පිහිටුවීමේ සැලැස්මක් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේනිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4846/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පහත සඳහන් කාණ්ඩ තුන යටතේ, එනම් නියෝජිතයින් මාර්ගයෙන්, සජීවී විකාශන පහසුකම් සැපයීම මගින් සහ සජීවී විකාශන පහසුකම් රහිතව ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වාර්ෂික පදනමින් කවරේද?

(ii) ඉහත එක් එක් ලියාපදිංචිවීම් සිදුවී ඇත්තේ කවර පුද්ගලයන්ගේ හෝ සමාගම්වල නම් යටතේද;

(iii) ඉහත ලියාපදිංචි කිරීම් අතරින් කවර හෝ ලියාපදිංචි, කිරීමක් යම් සමාගමක් යටතේ ලියාපදිංචි කර ඇත්නම්, එම සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) ඉහත (i) හි සඳහන් කාණ්ඩ තුන යටතේ එකතු කර ගත් අයබදු ප්‍රමාණය 2005 සිට 2013 වර්ෂය දක්වා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේනිද?

(ආ) නො එසේනම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4847/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එවන් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන්ගේ සහ / හෝ සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

4851/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා,

(i) ''රූජිනෝ'' නොවන ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරය සිදුකර ගෙන යාම සඳහා වර්ෂයකට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත කී එක් එක් ලියාපදිංචි කිරීම් සිදුකර ඇත්තේ කවර සමාගම් හෝ පුද්ගලයන්ගේ නම් යටතේද;

(iii) එකී එක් එක් ලියාපදිංචි සමාගමෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) රූජිනෝවලින් එක් එක් වර්ෂය තුළදී අය කර ගන්නා ලද මුළු අය බදු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2224/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, ''සැමට නිවසක් - හිතට සෙවණක්'' වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3248/'12

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රේගුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3708/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සඳහා අනුමත කොට ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයා යටතේ පත්කර ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සම්බන්ධීකරණ ලේකම්වරුන් පත්කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(iv) එම එක් එක් ලේකම්වරයාගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එක් සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වෙනුවෙන් ගෙවනු ලබන වැටුප, අනෙකුත් දීමනා සහ ලබා දෙන පහසුකම් කවරේද;

(vi) ඒ අනුව සම්බන්ධීකරණ ලේකම්වරුන් වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දරා ඇති සමස්ත පිරිවැය කොපමණද;

(vii) එම පිරිවැයට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්යභාරයක් එම ලේකම්වරුන් විසින් ඉටුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3831/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන - කොටපොළ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම මාර්ගය සඳහා මූල්‍යාධාර ලබා ගන්නා ලද මූලාශ්‍ර කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iv) මේ වන විට ඇස්තමේන්තු ගත මුදල ඉක්මවා වැය වී ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මුලටියන - කොටපොළ මාර්ගය පුළුල් කිරීමේදී අත්පත්කර ගන්නා ලද ස්වර්ණභූමි ඉඩම් හා සින්නක්කර ඉඩම් වෙනුවෙන් එම ඉඩම් හිමියන්ට කිසිදු වන්දි ගෙවීමක් සිදු නොකර මාර්ගයේ ඉදිරි කටයුතු කරන බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) වෙනත් මාර්ග පුළුල් කිරීමේදී අදාළ පාර්ශ්වයන්ට වන්දි ලබාදීමේදී කටයුතු කරන ආකාරයට ඉහත මාර්ගය සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) මේ පිළිබඳව නැවත විමර්ශනය කර ඉහත ඉඩම් හිමියන්ට වන්දි ගෙවීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3906/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයට අයත්, මුහුදුබඩ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, "කුලාරිප්පු" වන රක්ෂිතය, මාන්කුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "මට්ටු සුඩාන්" රජයේ වනාන්තරය සහ මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි, මඩු හා මාන්තායි බටහිර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනට අයත් වන රක්ෂිතවල අක්කර විශාල ප්‍රමාණයක් එළිපෙහෙළි කරමින් පවතින්නේද;

(ii) ඉහත එක් එක් වනාන්තර භූමියෙන් මේ වන විට එළිපෙහෙළි කර ඇති බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වනාන්තර භූමි ප්‍රදේශ එළිකිරීමේ අරමුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4289/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුව මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතාවය හේතුවෙන් එම බැංකුවේ කොටස් නිකුතුවක් සිදුකිරීමට 2013 අගෝස්තු මස 15 වැනි දින අමාත්‍ය මණ්ඩල තීන්දුවක් ගෙන තිබේද;

(ii) 1961 අංක 29 දරන මහජන බැංකු පනතට අනුව කොටස් වෙළඳපොළ තුළ එම බැංකුවේ කොටස් නිකුතුවක් සිදුකිරීමට නොහැකි හෙයින් එකී බැංකු පනත සංශෝධනය කරන්නේද;

(iii) මහජන බැංකුව විසින් කොටස් වෙළඳපොළට මුදා හරිනු ලබන කොටස් මිලදී ගැනීම සඳහා පෞද්ගලික අංශයට අවකාශ ලැබීම මගින් එම බැංකුවේ අයිතිය රජයේ පාලනයෙන් ගිලිහී යන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4442/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය කාර්මික විද්‍යාලයට ලබා දුන් පහසුකම් කවරේද;

(ii) එකී පහසුකම් ලබාදීම වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

(iii) එම ප්‍රතිපාදන යටතේ සිදු කළ නවීකරණ කටයුතු සහ පහසුකම් ලබාදීමේ කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර අවසන් කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4558/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිවසක හිමිකමක් නැති, අඩු ආදායම්ලාභී, විදේශගත ශ්‍රමිකයින් සඳහා "රටවිරුවෝ ණය වැඩසටහන" නමින් නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(ii) එම ණය ලබාදීම සිදු කරනු ලබන බැංකු කවරේද;

(iii) එම එක් එක් බැංකුවේ මෙරට ක්‍රියාත්මකව පවතින ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ණය ව්‍යාපෘතිය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට සහ ඊට අදාළව සිදුකර ඇති අනෙකුත් පරිපාලන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත වැඩසටහන යටතේ ණය මුදලක් ලබා ගැනීම සඳහා අදාළ වන කොන්දේසි සහ සුදුසුකම් කවරේද;

(ii) එක් අයකුට ලබා දෙන උපරිම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල වෙනුවෙන් අය කරනු ලබන පොලී අනුපාතය කොපමණද;

(iv) මේ වන විට එම ණය මුදල ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව සහ ණය ලබා දී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4567/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කර ඇති ආකාරයට වයස අවුරුදු 18 සිට 22 දක්වා සෑම අයෙකුටම තම අභිමතාර්ථය අනුව අවශ්‍ය තෘතීයික අධ්‍යාපනයක් හෝ පුහුණුවක් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ දෙකක් දක්වා මුදලක් වෙන්කර දීම සඳහා රජය කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එම පහසුකම ලබා ගෙන ඇති තරුණ තරුණියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම මූල්‍ය පහසුකම ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) ලබා දෙන එම මුදල නැවත අය කර ගනු ලබන්නේද;

(v) එම මුදල නැවත අය කර ගනු ලබන්නේ නම්, එකී මුදල භාවිතා කරනු ලැබූ අධ්‍යාපනය හෝ පුහුණුව අවසන් කිරීමෙන් කොපමණ කාල සීමාවකට පසුව එය අය කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා එම පහසුකම ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර නොමැති නම්, මහින්ද චින්තන ඉදිරි දැක්ම මගින් එම තරුණ තරුණියන්ට ලබා දී ඇති එම පොරොන්දුව යථාර්ථයක් බවට පත් කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4586/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලෙයි විදුලි බලාගාරයෙහි භාවිතා කිරීම පිණිස මෑතක දී ආනයනය කළ ගල් අඟුරු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් අරඹා තිබේද;

(ii) ඉහත කී ආනයනයට සම්බන්ධ ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත කී කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් අරඹා ඇත්තේ මන්ද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ගල් අඟුරු බහාලුමෙහි ආනයනකරුවාගේ නම කවරේද;

(ii) ඉහත කී ආනයනකරුවා තෝරාගත්තේ කෙසේද;

(iii) ආනයනකරුවාගෙන් අලාභය අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ගල් අඟුරු ආනයනය සම්බන්ධයෙන් අනාගතයේදී එවැනි තත්ත්වයක් නැවත ඇතිවීම වළක්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4746/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අඛණ්ඩව පාඩු ලැබීමට හේතු වී ඇති කරුණු කවරේද;

(ii) සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කළ දිනය කවරේද;

(iii) එම තෙල් පිරිපහදුවේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(iv) වර්ෂ 2011 සිට 2013 දක්වා කාල සීමාවේ දී වාර්ෂිකව මෙරටට ගෙන්වන ලද බොරතෙල් ප්‍රමාණය කොපමණද;

(v) බොරතෙල් ආනයනය අඩු වීම නිසා පිරිපහදු කළ තෙල් ගෙන්වීම හේතුවෙන් රජයට අලාභයක් සිදු වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4796/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය මගින් ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, යොමු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම පිරිස තෝරා ගත් පදනම කවරේද;

(ii) එම පිරිස තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ වෙනත් ප්‍රචාරණ විධි ක්‍රමයක් අනුගමනය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4809/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවට අයත් කුගල ගම්මානයට සපයනු ලබන පානීය ජලය සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බවත්;

(ii) මේ දක්වා සපයන ලද පානීය ජලයට යකඩ මිශ්‍ර වී ඇති බවට ජනතාව පවසන බවත්;

(iii) එම තත්ත්වය යටතේ මේවන විට ඔවුන්ට රු. 35.00 ක් ගෙවා එක් පානීය ජල භාජනයක් (බූලියක්) මිලදී ගැනීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කුගල ගම්මානයේ පානීය ජලය සම්බන්ධයෙන් පවතින ගැටලුකාරී තත්ත්වය කඩිනමින් විසඳීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4843/'14

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, බඩල්කුඹුර, මැදගම හා මොණරාගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මායිම්ව ගලා බසින "කුඹුක්කන් ඔය" හරස් කර "නක්කල ජලාශය" නමින් වාරි ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(ii) එම වාරි ව්‍යාපෘතිය සඳහා මුදල් ආයෝජනය කරනු ලබන ආයතනය කවරේද;

(iii) මෙම ජලාශය ඉදිකිරීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නක්කල ජලාශය ඉදිකිරීමේ දී ඊට යටවන සමස්ත ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළව රක්ෂිතය ලෙස වෙන් කරනු ලබන ප්‍රදේශයෙන් ඉවත් කරන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය වෙනුවෙන් පවරා ගනු ලබන සියලු ඉඩම් සඳහා ඒවායේ හිමිකරුවන්ට වන්දි ලබාදීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4869/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූගත ජලය ආම්ලිකකරණය වීම නිසා තම ජල අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකිව සිටින රතුපස්වල හා ඒ අවට ප්‍රදේශවල ජනතාවට නල ජලය ලබා දෙන දිනය කවරේද;

(ii) ඒ සඳහා ජල පාරිභෝගිකයින්ගෙන් මූලික මුදලක් අය කරනු ලබන්නේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) දැනට ජල නල එලා ඇති මාර්ගවලට අමතරව අනෙකුත් අතුරු මාර්ගවල පිහිටි නිවෙස් සඳහා ජලය ලබා දීමේදී මූලික ගෙවීමට අමතරව වෙනත් මුදලක් අය කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රතුපස්වල හා අවට ප්‍රදේශයේ ජනතාවට නල ජලය ලබා දීමේ ව්‍යාපෘතිය නිම කරන තෙක් එම ජනතාවට අවශ්‍ය පානීය ජලය අඛණ්ඩව බවුසර මගින් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2014 ජූලි මස 22 වැනි අඟහරුවාදා)

4559/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— බන්ධනාගාර හා පුනරුත්ථාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1989 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ මරණ දඬුවම නියම වූ සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාල සීමාව තුළ මරණ දඬුවම නියම වූ එක් එක් අයගේ නම, ලිපිනය, දඬුවම් නියම කරන ලද අධිකරණය, දඬුවම් නියම වූ දිනය සහ නඩු අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම් ලැබූ ඉහත සඳහන් අය අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරුණු බලතල අනුව එම දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට පරිවර්තනය කරනු ලැබූ අයගේ නම්, ලිපිනයන් සහ ඊට අදාළ දිනයන් කවරේද;

(ii) වර්ෂ 1989 සිට 2005 දක්වා සහ 2012.06.01 සිට මේ දක්වා කාල සීමාවන් තුළදී ජනාධිපති සමාව යටතේ නිදහස් කරනු ලැබූ අයගේ නම්, ලිපිනයන් සහ නිදහස ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2581/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුනේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3249/'12

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3833/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව්වල රොන්මඩ ඉවත්කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) මෙම වැඩසටහන සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iii) රොන්මඩ ඉවත්කිරීමේ කොන්ත්‍රාත් ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ඉදිරිපත් කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව්වල රොන්මඩ ඉවත්කිරීමේ කටයුතු වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට මේ දක්වා මුදල් ගෙවා නොමැති බව දන්නේද;

(ii) ඔවුන්ට මෙතෙක් මුදල් නොගෙවීමට හේතු කවරේද;

(iii) කොන්ත්‍රාත්කරුවන් සඳහා මුදල් ගෙවන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3940/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, ශ්‍රී දළදා මාළිගාවට මීටර් 500 ක් ආසන්නයේ පවත්වාගෙන යනු ලබන මත්පැන් අලෙවි සැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මත්පැන් අලෙවි සැල් සඳහා අවසර ලබා දී ඇති අය කවුරුන්ද;

(iii) මත්පැන් අලෙවි සැලක් සඳහා බලපත්‍රය ලබාදීමේදී පාසල්වල හා පන්සල් ඇතුළු පූජනීය ස්ථානවල සිට එම මත්පැන් අලෙවිසැලට තිබිය යුතු නියමිත දුර ප්‍රමාණය කොපමණද;

(iv) එවැනි බලපත්‍රයක් ලබාදීමේදී සළකා බලනු ලබන අනෙකුත් සීමාවන් කවරේද;

(v) ඉහත (iii) හා (iv)හි සඳහන් සීමාවන් අනුව දළදා මාළිගාව ආසන්නයේ පිහිටි ඉහත මත්පැන් අලෙවි සැල් නීති විරෝධී වන්නේද;

(vi) ඒ අනුව, එම මත්පැන් අලෙවි සැල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4104/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ ජෛව විවිධත්වයක් සහිත සංරක්ෂිත වනාන්තරයක් වන පිදුරුතලාගල කඳු වැටියේ බටහිර බෑවුමේ අර්තාපල් වගාව හා එළවළු වගාව වෙනුවෙන් විශාල භූමි ප්‍රමාණයක් එළිපෙහෙළි කර තිබේද;

(ii) එසේ නම්, එම එළිපෙහෙළි කිරීම සිදුකළ පාර්ශ්වයන් කවුරුන්ද;

(iii) ඔවුන්ට මේ සඳහා අවසර ලබා දුන් අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4333/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වාහන දුම් පරීක්ෂාව සිදුකිරීමට එම පරීක්ෂාව සිදුකරනු ලබන සමාගම් විසින් අය කළ යුතු ගාස්තු තීරණය කරනු ලබන බලධාරියා කවුරුන්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ ආයතන විසින් භාවිතාකරනු ලබන වාහන සඳහා දුම් පරීක්ෂාව සිදුකරනු ලබන්නේද;

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස්රථ එම පරීක්ෂණයට භාජනය කරනු ලබන්නේද;

(iii) එසේ නම්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් තම බස්රථ සඳහා දුම් පරීක්ෂණය සිදුකර ගැනීමට වාර්ෂිකව අදාළ ආයතනවලට ගෙවනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට මාර්ගවල ධාවනයේ පවතින වාහනවලින් සිදුවන දුම් පිටවීම නිරීක්ෂණය කිරීමෙන් වාහන දුම් පරීක්ෂණය සෑහීමකට පත්විය හැකි පරිදි සිදුවන බවට සහතික විය හැකිද;

(ii) එසේ නම්, ඊට පදනම් කර ගන්නා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4443/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ නව නිවාස ඉදිකර දීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හඳුනාගෙන තිබූ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා රජය මගින් ලබා දීමට අපේක්ෂා කළ ප්‍රතිපාදන කවරේද;

(iii) එකී ප්‍රතිපාදන මත සිදුකළ නිවාස ඉදිකිරීම් කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර නිමකර ජනතා අයිතියට පත් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4569/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හුදකලා පාසල් යනුවෙන් හඳුන්වනු ලබන පාසල් එසේ වර්ගීකරණය කිරීම සඳහා පදනම් කරගත් නිර්ණායක කවරේද;

(ii) දැනට පවතින හුදකලා පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2013 වර්ෂයේ අයවැය යෝජනාවන්ට ඇතුළත්වූ ඉහත සඳහන් පාසල් සිසුන්ට වසර මැද දී අතිරේක නිල ඇඳුම් රෙදි කට්ටලයක්, නොමිලේ පාවහන් යුගලක් සහ ධාන්‍ය, බිත්තර සහ කිරි සහිත ආහාර වේලක් ලබාදෙන බවට වූ යෝජනා අනුව එම එක් එක් පහසුකම ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ සඳහා වාර්ෂිකව රජය වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4584/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශගත ශ්‍රමිකයින්ගේ දායක මුදලින් ක්‍රියාත්මක වන අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදී ඇති බවත්;

(ii) ආරම්භයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කර පසුකාලීනව විදේශ රැකියා ඒජන්සි සමාගමක් වෙත පැවරූ එම රක්ෂණ කටයුතු එකී සමාගම විසින් තැරැව්කාර සමාගමක් මගින් එම්. බී. එස්. එල්. රක්ෂණ සමාගම වෙත පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා ඒජන්සි සමාගම විසින් එකී තැරැව්කාර සමාගමේ සේවා ලබාගැනීම ඇරඹූ දිනය කවරේද;

(ii) විදේශගත ශ්‍රමිකයකුගෙන් අය කරන වාරිකයෙන් එම තැරැව්කාර සමාගම වෙත ගෙවනු ලබන ප්‍රතිශතය කවරේද;

(iii) මේ දක්වා එම සමාගම වෙත ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් එම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කළ විටදී තැරැව්කරුවකුගේ සේවය ලබාගත්තේද;

(v) තැරැව්කරුවෙකුගේ සේවය ලබා ගැනීමෙන් අත් වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තැරැව්කාර සේවා වෙනුවෙන් ගෙවූ ගාස්තු ලබා ගත් තැරව්කාර සමාගම් නියෝජිතයා කවුරුන්ද;

(ii) එම නියෝජිතයා එකී ගාස්තු ගෙවන ලද මුළු කාල පරිච්ඡේදය මුළුල්ලේම එම සමාගමේ සේවයෙහි නිරතව සිටියේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4744/’14

ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිටින විදුලිය නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි දිගු මගින් විදුලි සැපයුම ලබාදීමට ඇති ස්ථාන සඳහා විදුලි දිගු ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) අඩු විදුලි ධාරිතාවක් ඇති නගරවල විදුලි ධාරිතාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4810/’14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, උඩප්පුව ධීවර ගම්මානයට ධීවර තොටුපළක් නොමැති බවත්;

(ii) පාසල් සිසුන් හා රෝගීන් තොටුපළ හරහා ගමන් කිරීමේදී නොයෙක් දුෂ්කරතාවලට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) උඩප්පුව ධීවර ගම්මානයට සුදුසු තොටුපළක් ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4853/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මත්තල, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළට අදාළව,

(i) එක් එක් ගුවන්සේවා පදනමින් පසුගිය මාස 12 සඳහා එක් එක් මාසය තුළ ආරම්භ වූ සහ අවසන්වූ (සංක්‍රමණ නොවන) ජාත්‍යන්තර ගුවන් ගමන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් ගුවන්සේවා පදනමින් පසුගිය මාස 12 සඳහා එක් එක් මාසය තුළ ඉපැයූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4872/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහස්ථ එල්.පී. ගෑස් මිල පාලනයේ දී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අවධානය යොමු කරවා ඇත්තේ 12.5 kg ධාරිතාවයකින් යුත් ගෑස් සිලින්ඩරයක මිල සම්බන්ධයෙන් පමණක් බවත්;

(ii) එම හේතුවෙන් ධාරිතාව 12.5 kg ට අඩු කුඩා සිලින්ඩරවලට ගෑස් පුරවා, ගෑස් සමාගම් විසින් වැඩි මිලකට අලෙවි කිරීමට කටයුතු කරන බවත්;

(iii) එම කුඩා ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර වැඩි මිලට මිලදී ගැනීමට පෙළඹෙන්නේ 12.5 kg ධාරිතාවයකින් යුත් ගෑස් සිලින්ඩරයක් සඳහා එකවර මුදල් වියදම් කිරීමට හැකියාවක් නොමැති දිළිඳු ජනතාව බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ධාරිතාව 12.5 kg වන ගෑස් සිලින්ඩරයක මිලට සමානුපාතිකව ගෘහස්ථ භාවිතයට යොදා ගන්නා සියලු ගෑස් සිලින්ඩරවල මිල ද පාලනය කිරීමට කටයුතු කරන්නේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4913/'14

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍යාංශය හා පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති මගී ආවරණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් මගී ආවරණයක් සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම මගී ආවරණවලින් මේ වන විට ප්‍රයෝජනයට ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මගී ආවරණ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ලබාදීමේදී නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(ii) නොඑසේ නම්, එම කොන්ත්‍රාත් ලබාදී ඇති පදනම කවරේද;

(iii) එම කොන්ත්‍රාත් ලබාදීමේදී කොන්ත්‍රාත්කරුගෙන් හෝ අදාළ සමාගම් වෙතින් මුදල් ලබා ගෙන තිබේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4948/'14

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව මේ වන විට රුපියල් බිලියන 95ක් ඉක්මවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ බැංකු අයිරා වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 43කට අධික මුදලක් ගෙවීමට තිබේද;

(ii) මේ වන විට රාජ්‍ය බැංකු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iii) එසේ නම්, එම තත්ත්වය යටතේ ඉහළ ණය පොලී කොන්දේසි මත විදේශීය තෙල් සමාගම්වලින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2585/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ එක් පවුලකට මාසයක් ජීවත්වීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එක් පවුලකට එක් මාසයකදී ආහාර සඳහා සහ ආහාර නොවන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් පවුලකට ජීවත්වීම සඳහා මාසිකව අවශ්‍ය මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාමාජිකයින් තුන් දෙනෙකු සහිත පවුලකට මාසයක් ජීවත්වීම සඳහා රු.7500.00 ක මුදලක් ප්‍රමාණවත් වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3250/'12

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3834/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2013.03.19 දින වන විට සිටි සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, වැටුප් හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇති ඇතැම් අය විවිධ චෝදනාවලට ලක් වී ඇති පුද්ගලයින් බවත්;

(ii) ඇතැම් අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කම්කරු කොමසාරිස් කාර්යාලයේ නඩු විභාගවෙමින් පවතින බවත්;

(iii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය සඳහා දූෂිත චෝදනා ලැබ සිටි නිලධාරීන් පිරිසක් බඳවා ගෙන සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) හි සඳහන් තත්ත්වයන් නිසා මුළු මහත් රක්ෂණ සංස්ථාවම අපකීර්තියට සහ අගාධයට වැටෙමින් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා විවිධ චෝදනා ලබා ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා දූෂිත නිලධාරීන් එම සංස්ථාවේ සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4150/'13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම, තම්මැන්නාව ප්‍රදේශයේ මැණික් ඉඩම් වෙන්දේසියක් සිදුකරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම වෙන්දේසිය තුළින් උපයා ගන්නා ලද මුළු ආදායම කොපමණද;

(iii) එම මුදල් නියමිත ක්‍රියාපටිපාටියට අනුව ලබා ගත්තේද;

(iv) ඉහත වෙන්දේසියට අදාළව තවදුරටත් අයවිය යුතු මුදල් තිබේද;

(v) එම ඉඩම් වෙන්දේසියේදී ආහාර හා තේ වෙනුවෙන් දරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4176/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පාලනය වන කොළොන්නාව ප්‍රධාන සේවා ස්ථාන උපකරණ වැඩපොළෙහි අධීක්ෂණ කටයුතු සිදුවන්නේ කුමන නිලධාරියෙකු යටතේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂයේ ජූනි මාසය දක්වා කාල සීමාව තුළ ඉහත වැඩපොළෙහි,

(i) පොම්ප මිලදී ගැනීමට, අමතර කොටස් මිලදී ගැනීමට සහ ඉන්ධනහල් අලුත්වැඩියාවට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අමතර කොටස් විකිණීම තුළින් උපයන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2013 වර්ෂයේ ජූනි මාසය අවසන් වන විට එම වැඩපොළෙහි සේවයේ නියුතුව සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4630/'13

ගරු පී. හැරිසන් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් අපනයනය කිරීම සඳහා 2012 අයවැයෙන් රුපියල් මිලියන 200 ක් වෙන් කළ බවත්;

(ii) ඒ වෙනුවෙන් දකුණ, නැගෙනහිර, උතුරු මැද හා උතුර යන පළාත්වල සහල් අපනයන කලාප 4ක් පිහිටුවීමට යෝජනා කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සහල් අපනයන කලාප ආශ්‍රිතව රජය විසින් සහ පුද්ගලික අංශය විසින් ඉදිකර ඇති වී මෝල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් බදු සහන යටතේ ඉදිකර ඇති වී මෝල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් සහල් අපනයන කලාපවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඒ සඳහා තෝරා ගත් ගම්මාන එක් එක් කලාපය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වන විට එම එක් එක් කලාපයෙන් අපනයනය සඳහා ලැබෙන සහල් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ආ)(i) හි සඳහන් එම වී මෝල් පිහිටි ස්ථානවල නම් හා ලිපිනයන් කවරේද;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4712/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුරුන්කන් පොලිස් වසමට අයත්, මලුවරායර්, කට්ටෙයි අඩම්පන්, මඩුපාර, මුරුක්කන් ලිපිනයේ පදිංචිව සිටි මාරිමුත්තු ෂන්මුගම් මහත්මිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් එල්.ටී.ටී.ඊ. තර්ජන හමුවේ එම නිවස හැර ගොස් සරණාගතයින් ලෙස වෙනත් ප්‍රදේශයක ජීවත් වූ කාල සීමාව තුළ දී ඔවුන්ගේ නිවස පිහිටි ස්ථානයේ අධි බලැති විදුලි රැහැන් යෙදීම සඳහා වූ මහා පරිමාණයේ විදුලි කුළුණක් ඉදිකරනු ලැබ ඇති බවත්;

(ii) ඔවුන්ගේ නිවස ඉවත් කොට එම ස්ථානයේ විදුලි කුළුණක් ඉදිකිරීම වෙනුවෙන් මාරිමුත්තු ෂන්මුගම් මහත්මියට වන්දි මුදල් ලබා දීම නිර්දේශ කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය මහ කළමණාකරු විසින් අංක DGM (P&HM-R1) GEN හා 2011.07.07 දිනැති ලිපිය මගින් වව්නියාවේ

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පදිංචි නිවස අහිමි වී අසරණභාවයට පත්ව සිටින ෂන්මුගම් මහත්මියට ලබාදිය යුතු වන්දි මුදල් මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම වන්දි මුදල් නොපමාව ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4743/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාණිජ බැංකුවලින් ණය මුදල් ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ලාබ හෝ පාඩු නොමැති මට්ටමින් ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4811/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩප්පුව, සෙල්වපුරම් ගම්මානයේ මාර්ගය විටින් විට අබලන්ව පස් කන්දක තත්ත්වයට පත් වන බවත්;

(ii) පාසල් සිසුන් හා රෝගීන් එම මාර්ගය ඔස්සේ ගමන් කිරීමේදී නොයෙක් දුෂ්කරතාවලට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තත්ත්වය සලකා බලා එකී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4849/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම අවුරුදු තුනකට - හතරකට වරක් ගෘහ ඒකක (කුටුම්භ) ආදායම් හා වියදම් සමීක්ෂණය නම් වූ වාර්තාවක් පළකරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කී වාර්තාවට අනුව,

(i) 2006/07, 2009 සහ 2012/13 යන වර්ෂ සඳහා ජාතික මට්ටමින් මාසික මධ්‍යයන (නාමික) ගෘහ ඒකක ආදායම කවරේද;

(ii) නියමිත පාදක වර්ෂය මත 2006/07, 2009/10 සහ 2012/13 යන වර්ෂ සඳහා ජාතික මට්ටමින් මාසික මධ්‍යයන (මූර්ත) ගෘහ ඒකක ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4904/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදා රෝහලට ජපානයේ නිෂ්පාදිත විකිරණ යන්ත්‍රයක් මිලදී ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එය මිලදී ගත් දිනය කවරේද;

(iii) ඊට වැය කළ මුදල කොපමණද;

(iv) එය ගෙන්වන ලද සමාගමේ නම කවරේද;

(v) එම යන්ත්‍රය නාවික හමුදා රෝහලට භාර ගැනීමට පෙර තත්ත්ව පරීක්ෂාවකට භාජනය කර අනුමතිය ගෙන තිබුණේද;

(vi) එසේ නම්, එම අනුමතිය ලබාදුන් අයගේ නම් හා තනතුරු කවරේද;

(vii) විකිරණ යන්ත්‍රය සහ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව අදාළ සමාගම සමඟ වගකීමකට බැඳී තිබුණේද;

(viii) එසේ නම්, එම වගකීම් කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට ඉහත සඳහන් යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින්නේද;

(ii) නොඑසේ නම්, එය අක්‍රිය වූ දිනය කවරේද;

(iii) එම යන්ත්‍රය වගකීම් කාල සීමාව තුළදී අක්‍රිය වී ඇත්නම්, අදාළ සමාගම මගින් එය නොමිලේ අලුත්වැඩියා කර ගැනීමට හැකියාව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම යන්ත්‍රය මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4949/'14

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත්, කොලොන්නාව තෙල් නිමාවෙන් (CPSTL) 2/3ක කොටසක් ඉන්දියන් තෙල් සමාගමට ලබාදී තිබේද;

(ii) කොලොන්නාවේ පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අවටින් පවරා ගත් අක්කර 80ක ඉඩම ඉන්දියන් තෙල් සමාගමට නොමිලේ ලබාදීමට සාකච්ඡා පවත්වනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2672/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය හරස් ගේට්ටු නොමැති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල වර්ෂ 2010 සිට 2012 දක්වා කාල සීමාව තුළ,

(i) සිදුවී ඇති දුම්රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) සිදුවූ එම අනතුරු නිසා මරණයට පත්වූ සංඛ්‍යාව කොපමණද;

(iii) තුවාල ලැබූ සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග නිසා සිදුවන අනතුරු හේතුවෙන් හානි සිදුවන්නන්ට විශේෂ වන්දි ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එම වන්දි ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3251/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3835/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හබරාදුව, ලනුමෝදර පදිංචි ඒ. පියල් හේමන්ත මහතා 1991.01.15 වැනි දින පොලිස් සේවයට බැඳී දිවයිනේ විවිධ ප්‍රදේශවල සේවය කර ඇති නිලධාරියෙකු බවත්;

(ii) 2010 වර්ෂයේ සිට කැලණිය කොට්ඨාසයේ, පැලියගොඩ පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කළ බවත්;

(iii) ඔහු තම සේවා කාලය තුළදී පෙන්වන ලද විවිධ දක්ෂතා වෙනුවෙන් මූල්‍ය ත්‍යාගයන් පවා ලැබූ නිලධාරියෙකු බවත්;

(iv) 2011.04.13 වැනි දින රාජකාරී විවේකයෙන් පසු නිවසට පැමිණි අවස්ථාවේ දී සර්පයෙකු දෂ්ට කිරීම හේතුකොටගෙන මාස කිහිපයක් සිහිමූර්ඡා තත්ත්වයෙන් පසුවීම නිසා හේමන්ත මහතාට සේවයට වාර්තා කිරීමට හෝ තම අසනීප තත්ත්වය පිළිබඳව සේවා ස්ථානයට දැනුම්දීමට හෝ නොහැකි වී ඇති බවත්;

(v) මෙම තත්ත්වය යටතේ 2011.05.14 වැනි දින සිට ඔහු තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නියෝගයක් නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හේමන්ත මහතා පොලිස් සේවයේ යෙදී සිටියදී විවිධ දක්ෂතා දක්වන ලද නිලධාරියෙකු වූ බැවින් ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූලි මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2673/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්ඔය ජාතික වනෝද්‍යාන මායිමේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත්, නිල්ගල වනාන්තරයේ අක්කර 505 ක් එළිපෙහෙළි කොට එම භූමියේ මල්දම්අඹේ, පිටකුඹුර, බුළුපිටිය, සේරව හා පේරණ යන ගම්මානවල ජීවත්වන පවුල් 400ක් පදිංචි කරවීමේ සැලසුමක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය මගින් නිල්ගල රක්ෂිත වනාන්තරයේ පැවැත්මට හා ජෛව විවිධත්වයට සිදුවන හානි වැළැක්වීමට පියවර ගන්නේද;

(iii) වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමතියකින් තොරව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතට පටහැනි නීති විරෝධී ක්‍රියාවක් වන බැවින් එය වළක්වාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3252/'12

ගරු රවී කරුණානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3836/’13

ගරු බුද්ධික පතිරණ මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2013 දී අම්පාරේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේදී සමාජ සේවා අමාත්‍යාංශය මගින් ඉදිකරන ලද ප්‍රදර්ශන කුටිය සඳහා වැයකළ මුළු මුදල කොපමණද;

(ii) එම ප්‍රදර්ශනය පැවති කාල සීමාවට අදාළව එම අමාත්‍යාංශයේ නිලධාරීන්ට ගෙවන ලද වැටුප්, අතිකාල දීමනා හා වෙනත් දීමනාවන් සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(iii) දැයට කිරුළ ප්‍රදර්ශනයේ රාජකාරී කටයුතුවල නියැළි උක්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අනෙකුත් සේවකයින්ගේ ප්‍රවාහන කටයුතු සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැයට කිරුළ ප්‍රදර්ශන භූමියේ ඉදිකරන ලද ඉහත සඳහන් ප්‍රදර්ශන කුටිය මගින් ජනතාවට ලබා දුන් සේවාවන් කවරේද;

(ii) දීර්ඝ කාලීනව ජනතා පරිහරණය සඳහා යොදා ගත හැකි ආකාරයේ ගොඩනැගිලි එම ප්‍රදර්ශන කුටිය සඳහා ඉදිකරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම ගොඩනැගිලි මේ වන විට යොදාගනු ලබන කාර්යයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4151/’13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පුද්ගලයෙකු බඳවා ගැනීම සඳහා 2013 මාර්තු 18 දින සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වූයේ ඉහත තනතුර සඳහා පුද්ගලයෙකු ස්ථිර පදනමින් බඳවා ගැනීමද; නැතහොත්, තාවකාලිකව බඳවා ගැනීමද;

(iii) එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ඒ වෙනුවෙන් ඉදිරිපත් වූ එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය හා සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත අය අතරින් එම තනතුර සඳහා තෝරාගනු ලැබූ අයගේ නම හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(vi) එම තැනැත්තා බඳවා ගනු ලැබුවේ ස්ථිර පදනමින්ද; නැතහොත්, තාවකාලික පදනමින්ද;

(vii) ඔහු තාවකාලික පදනමින් බඳවාගනු ලැබුවේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4177/’13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මින්නේරිය රක්ෂිතය සහ ඒ අවට පිහිටා ඇති කටුකැලියාව, හළුවැව, රත්මලේ සහ හබරණ යන ප්‍රදේශවල බොරළු කැපීම සිදුවන බව දන්නේද;

(ii) එම රක්ෂිත ප්‍රදේශවලට ඇතුළුවීමට සහ බොරළු කැපීමට අවසර ලබා දුන් පාර්ශ්වය කවරේද;

(iii) එම බොරළු කැපීමට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර කවරේද;

(iv) බොරළු කැපීම සිදුකරනු ලබන ඉහත සඳහන් ප්‍රදේශයන් අයත් වන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4631/'13

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවි සෙත ලොතරැයිය ආරම්භ කිරීමට මූලික කර ගත් කරුණු කවරේද;

(ii) එම ලොතරැයිය ආරම්භ කරනු ලැබූ වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත අනුව ගොවි විශ්‍රාම වැටුපට දායක වූ ගොවි මහතෙකුට විශ්‍රාම වැටුප ලැබීමට තිබිය යුතු අවම සුදුසුකම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගොවි සෙත ලොතරැයිය ආරම්භයේ සිට මේ දක්වා එම ලොතරැයි අරමුදලින් ගොවි විශ්‍රාම වැටුපට බැර කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්; සහ

(ii) මේ වන විට අවශ්‍ය වයස් සීමාව සම්පූර්ණ කිරීම මත ගොවි විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර ඇති ගොවීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4713/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාතේ, මාතලේ අධ්‍යාපන කලාපයට අයත්, මා/දුල්ලෑව විදුහලේ උප ගුරුවරයෙකු ලෙස සේවය කරමින් සිටි, ඒ. එල්. එම්. නසීස් මහතා එතෙර නිවාඩු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද පොදු 126 ආකෘති පත්‍ර අනුව මාතලේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ මා/ගුරුආ/7/281 හා 1989.06.05 දිනැති ලිපිය මගින් 1987.04.01 දින සිට 1992.03.31 දින දක්වා වැටුප් රහිත එතෙර නිවාඩු අනුමත කිරීම නිර්දේශ කරනු ලැබ ඇති බවත්;

(ii) මාතලේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අංක මා/ගුරුආ/4/53 හා 2007.11.30 දිනැති ලිපිය මගින් නසීස් මහතාගේ වසර 15ක සතුටුදායක සේවය සැලකිල්ලට ගෙන මොහු නැවත සේවයේ පිහිටුවීම සුදුසු යැයි මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නිර්දේශ කොට තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ප්‍රමාද දෝෂයකින් සේවය අත් හැර යාමේ නිවේදනය නිකුත් කිරීම නිසා අසරණභාවයට පත්ව සිටින නසීස් මහතා නැවත සේවයේ පිහිටුවීමට හෝ විශ්‍රාම ගැන්වීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4755/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පොල් වතු සංඛ්‍යාව කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් නිෂ්පාදනය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4850/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට එක් පුද්ගලයෙකුට මසකට දැරීමට සිදුවන අවම වියදම මත පදනම්ව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම මසකම දිස්ත්‍රික් දරිද්‍රතා රේඛාව ප්‍රසිද්ධ කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කය සඳහා පවතින නවතම නිල දරිද්‍රතා රේඛාව කවරේද;

(ii) ඉහත කී දරිද්‍රතා රේඛාව ගණනය කිරීමේදී පදනම් කරගනු ලබන "මූලික අවශ්‍යතා" කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4905/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂයේදී ඉහත විභාගය සමත්වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සිසුන්ගෙන් ශිෂ්‍යාධාර මුදල් හිමිකම ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) ශිෂ්‍යාධාර හිමි සිසුවෙකුට මාසිකව ලබාදෙන ශිෂ්‍යාධාරයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්ව කොළඹ රාජකීය විද්‍යාලය, ආනන්ද විද්‍යාලය සහ විශාඛා විද්‍යාලය යන පාසල්වල 6 වසර සඳහා සුදුසුකම් ලැබ, ඇතුළත් කරනු ලැබූ සිසුන් සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4950/'14

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පීවී ඔයිල්" නමැති සිංගප්පූරු සමාගම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පාලන අධිකාරිය විසින් 2011.10.07 සහ 2012.01.25 දින අවස්ථා දෙකකදීම අත්සන් කළ දූෂිත ගිවිසුම නැවත අලුත් කිරීමට සූදානම් වන බවත්;

(ii) මාස හයක කාල සීමාවකට පෙට්‍රල් මෙට්‍රික් ටොන් දෙලක්ෂ හතලිස් දාහක් ආනයනය කිරීම සඳහා එම සමාගම සමඟ අත්සන් කළ ගිවිසුමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් කෝටි 116ක් පාඩුවූ බවත්;

(iii) 2013 වර්ෂයේ දී එම ගිවිසුම නැවත අත්සන් කිරීමට තීරණය කර තිබූ බවට වෘත්තීය සමිති චෝදනා නැගූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් දූෂිත ගිවිසුම් හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දිනෙන් දින පාඩු ලබන්නේද;

(ii) එම පාඩු පියවා ගැනීම සඳහා වරින් වර ඉන්ධන මිල ඉහළ දමන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2674/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සිංගප්පූරුවේ ‘බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්’ සමාගම වෙතින් පසුගිය කාලයේ ගෙන්වූ ‘හොඳ ගුවන්යානා තෙල්’ සමඟ වෙනත් ටැංකියක ‘බාල ගුවන්යානා තෙල්’ මෙට්‍රික් ටොන් 7500ක් ආනයනය කළේද;

(ii) ගුවන් යානා තෙල් ආනයනයේදී සිදුවී ඇති ඉහත අක්‍රමිකතාව නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවූ පාඩුවේ වටිනාකම රුපියල්වලින් සහ අමරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අක්‍රමිකතාව සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව මේ දක්වා ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉහත සඳහන් තෙල් ආනයනයෙන් පසුව ‘බ්‍රිටිෂ් පෙට්‍රෝලියම්’ සමාගමින් ඉන්ධන මිල දී නොගත යුතු බවට ටෙන්ඩර් කමිටුව ඒකමතිකව තීරණයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3270/’12

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට දිවයිනේ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 සහ 2012 වසරවල දෙසැම්බර් 31 වැනි දින වන විට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එබඳු සමාජ සහනාධාරයක් ලබාදීම පිණිස සලකා බලන නිර්ණායක කවරේද;

(iv) 2010, 2011 සහ 2012 වර්ෂවලදී මාසිකව සහ වාර්ෂිකව ඔවුන්ට ලැබුණු දීමනාව මත පදනම්ව සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාවේ ප්‍රභේදනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිලදී ගැනීමේ ශක්තිය හෝ ක්‍රය ශක්තිය හෝ උද්ධමන ප්‍රවණතාවන්ට සාපේක්ෂව සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා අරමුදල් නැවත වෙන්කිරීමක් සිදුකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3918/13

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 - 2005 අදියර I ග්‍රේටර් කැන්ඩි, මහනුවර උතුර, හාරිස්පත්තුව සහ ගොහාගොඩ ජල පොම්පාගාර සඳහා මහවැලි ගඟෙන් දිනකට ලබා ගන්නා ජල ප්‍රමාණය කොපමණද;

(ii) එම ජල පොම්පාගාර මගින් පානීය ජලය සපයනු ලබන පෞද්ගලික නිවාස, රජයේ නිවාස, පාසල් ඇතුළු රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, රජයේ සහ පෞද්ගලික කර්මාන්තශාලා සහ පූජනීය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) ගොහාගොඩ කුණු කන්ද ආසන්නයේ පිහිටා ඇති ඉහත ජල පොම්පාගාර ඔස්සේ බෙදාහරින පානීය ජලය මගින් අහිතකර රසායනික ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මිනිස් සිරුරට එකතුවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4152/'13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජගත් පරිසර දිනය වෙනුවෙන් වැයකරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) අමාත්‍යාංශයේ අරමුදල්වලට අමතරව වෙනත් ආයතන වෙතින් ඒ සඳහා මුදල් සපයා ගැනීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ආයතන සහ ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණයන් කවරේද;

(v) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, රාජ්‍ය දැව සංස්ථාව, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන ආයතන වෙතින් ජගත් පරිසර දිනය වෙනුවෙන් රුපියල් ලක්ෂ 70 බැගින් ලබාගෙන තිබේද;

(vi) නොඑසේ නම්, එසේ මුදල් ලබා ගැනීමට අපේක්ෂා කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?